ගුනසිංහ කවි කෘති ත්‍රිත්වයෙන් දෙකක් ම පරිශීලනය කළ ද එහි වන බුද්ධිවාදී ගුණය අවශෝෂණය කර ගත්තද, හැත්තෑ එකේ කැරැල්ලේ ඇකයේ බිහිවුණු අප පරම්පරාව තුළට කවිය ගෙන එන්නේ 87 - 90 චලනයන් විසින් වීම නිසා ගුනසිංහයයන් අපට අත්හැරෙනු ලැබීම තාර්මේ තාර්කික පදනමක් තිබේ. නමුත් අඛන්ඩව "අලුත් මිනිහෙක්" පසුපසම ලුහුබැඳ ගියේ නම් අප පරම්පරාවේ කවිය ඉවරවන්නේ ජාතිකවාදී මමංකාරයේ ගුවන්ගත වීමෙන් හෝ ජනතාවාදී මඩගොහොරුවේ කරවටක් එරීමෙනි. පරාක්‍රම කොඩිතුවක්කු පිටුපස ආශ්වාදනීය සෙයියාවෙන් ඉදිරියටම ගියවුන්ට සිදුවූයේ වන් ෂොට් පන්නයේ සමාජ - සිනමා විචාරකයන් පමණක් වීම මිස නිර්මාණකරුවන් බවට පත් වීම නොවේ.

කෙසේ වතුදු "සිංහල" කවිය තීරණාත්මක ලෙස ජාතිකවාදයෙන් මුදවන්නේ කිසිදු සිංහල කවියකු නොවේ. ඒ දෙමළ විමුක්ති අරගලයේ ලිට්මස් පරීක්ෂාවයි. සිංහල කවියේ ව්‍යාජ ජනතාවාදී වෙස් බැන්දුම් ගළවා දමන්නේද කිසිදු සිංහල කවියකු නොව, දෙමළ විමුක්ති අරගලයේ ලිට්මස් පරීක්ෂාවයි. නමුත් සුපරීක්ෂාකාරී අධ්‍යනයක යෙදුනහොත් මෙකී ජාතිකවාදයෙන් හා ජනතාවාදයෙන් සමාජය වෙනස් කිරීමේ විභවය සිරි ගුනසිංහගේ නූතනවාදී ප්‍රවේශයේ පැවති බව වැටහෙන්නේ වෙයි. නමුත් ගුනසිංහ සමාජය තුළ බරපතල කියැවීමකට ලක්වන්නේ නැත. ඔහු ම ම්ලේච්ඡ සමාජයක් ලෙස නම් කළ සිංහල සමාජයේ ඔහු භෞතිකව නොසිටීම ඊට හේතු වන්නට පිළිවන. ඒ අර්ථයෙන් ඔහු ප්‍රමාණවත් කියැවීමකට ලක් නොවීමම දැනුවත් ප්‍රවේශයක් වෙන්නේ වෙයි.

ඉදින් අවසානයේ, සිරි ගුනසිංහගේ නික්ම යාම සමාජයක් වශයෙන් විශාල කම්පනයක් ඇති කරන බවක් නොපෙනිණ. පුද්ගලිකව ගත් කල මට පවා ඇති වූයේ යම්තාක් දුරස්ථකරණය වූ වේදනාවකි. මෙයට හේතුව කුමක්ද? ඔහුගේ භාවිතය සමාජය හා ඓන්ද්‍රිය නොවීමද?

"ඉතිහාසය අලුත්වැඩියා කරන්න බැහැ. ඉතිහාසයෙ සිද්ධිය ඒ විදිහමයි" ඔහු වරක් පැවසී ය. ඒ දේශපාලනය අදාළව ය. ඒත් ඒ උපුටනය ඔහුගේ ජීවිතයට අදාළව ද යළි උපුටාලිය හැකි ය.

ඉදින්, සිරි ගුනසිංහයන් ස්වකීය භෞතික ශරීරිය හැර ගොසිනි. නමුත් ඔහු ගොඩනැංවූ ඉතිහාසය වෙනස් කළ නොහැකි ය. දශක ගණනාවකට පෙර ඔහු තැබූ නූතනවාදයේ පිය ලකුණ සදාතනික ය. මන්ද යත් ඔවුන් ආ පසුව් ආරම්භක නිසඳැස් කවියේදීම මෙසේ පවසා තිබිණ.

"....මහ රෑ
බල මැන යතුරු සිදුරින්
සෙලු ගන අඳුර පමනයි
ඇයි ද ඔය බිය, ඔය පුදුමය
නොනැසී බිසෙෂන අතීතය
වැලඳ දිනෙන් දින
දුරට යන අනාගතය
බලා ඔබ දෙස
කරයි සරදම්"



# මොයි දූපතේ අභිරහස් පිළිම

Easter Island නොහොත් Rapa Nui යනු පැසිෆික් සාගරයේ පිහිටි චිලී රාජ්‍යට අයත් පොලිනීශියානු (Polynesian) දූපතකි. එය චිලී හි බටහිර ඉවුරට සැතපුම් 2300ක් දුරින් පිහිටා ඇත. මෙයට එම නම ලැබී ඇත්තේ එහි පැමිණි ප්‍රථම යුරෝපීයා වූ ලන්දේසි ජාතික Jacob Roggeveen 1722 අප්‍රේල් 5, Easter ඉරිදාවක ගොඩ බැසි නිසාය.

මෙම දූපත, එහි පිහිටුවා ඇති Moai ලෙස හඳුන්වන අතිවිශාල ගල් පිලිම 887 නිසා ලොව ඉමහත් ප්‍රසිද්ධියට පත්ව ඇත. මේවා 1100 -1680 AD අතර කාලය තුල එහි විසූ Rapa Nui ජනතාව විසින් ඉදිකරනු ලැබ ඇතයි සැලකේ.




Moai පිලිම සියල්ලම පාහේ නිර්මාණය කර ඇත්තේ ගිනි කඳුවලින් ඇතිවූ පාෂාණ වලිනි. පිලිමයක මධ්‍යන්‍ය උස අඩි 14 (මීටර 4) පමණ වන අතර බර ටොන් 13 ක් පමණ වේ. Paro ලෙස හඳුන්වන විශාලතම පිලිමය අඩි 32.15 (මීටර 9.8) වන අතර බර ටොන් 82 ක් පමණ වේ. බොහොමයක් පිලිම Ahu ලෙස හඳුන්වන පාෂාණ පාදමක් මත තබා ඇත. දැනට Ahu 313 ක් ඇති අතර ඉන් 125 ක පමණ Moai පිලිම තබා ඇත.

Moai පිලිම බහුතරයක පපු ප්‍රදේශය සහ උරහිස ඇති අතර , තවත් සමහරක අත් සහ ඇඟිලිද ඇත. එක පිලිමයක පමණක් පාද ඇත. හිස ශරීරයට වඩා 3/5 පමණ විශාල වන ලෙස සාදා තිබීම විශේෂත්වයකි. බොහෙ-ාමයක් පිලිම එවා සාදන ලද ගල් ආකරය වූ , Rano Raraku, හි ඇත. ඒවා නියමිත ස්ථානයට ගෙනයාමේ අපේක්ෂාවෙන් එසේ තබා ඇතයි සැලකේ. තවත් පිලිම 92ක් එවා නියමිත ස්ථානයට ප්‍රවාහනය කරන අතරතුර තිබුනායයි සැලකෙන අතරමග ස්ථානවල ඇත.

සමහරක් පිලිමවල හිස මත රතු පැහැති තොප්පි වැනි දෙයක් තබා ඇත.

මේවා Pukao (Topknots) යන නමින් හඳුන්වන අතර මෙමගින් හිසකෙස් නිරූපනය වනවා යයි සැලකේ. රතු පැහැති ,scoria, නම් ගිනිකඳු පෂාණ වලින් මෙය සාදා ඇත.එක් පිලිමයක් නිම කිරීමට 5 - 6 ත් අතර කණ්ඩායමකට වසරක්වත් ගත වන්නට ඇතයි සැලකේ.



,Moai, පිලිම කුමන අරමුනක් උදෙසා නිර්මාණය කලාද, කෙසේ නියමිත ස්ථානයට ගෙනගියාද යන්න තවම ලොවට අභිරහසක් ව පවතී.

1995 දී UNESCO ව විසින් Easter Island ලෝක උරුම ප්‍රදේශයක් ලෙස නම් කරන ලදී.

අනුග්‍රහය - නවලෝ දැණුම වෙබ් අඩවිය